# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 8 දරන ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2000 මාර්තු මස 27 වන දින.]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 මාර්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

# 2000 අංක 8 දරන ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2000 මාර්තු මස 27 වන දින]

එල්. ඩී.–ඕ. 64/96.

## ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් ඒ ආයතනයේ පරමාර්ථ සහ ඒ ආයතනයට සම්බන්ධ සියලු කාරණා ඒ ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව සාර්ථක ලෙස ඉෂ්ට කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවාගෙන තිබුනු හෙයින් ද : පූර්විකාව.

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහාද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් ඒ ආයතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එම ආයතනය සංස්ථාගත කරනු ලැබීමට දැන් ඉල්ලුම් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2000 අංක 8 දරන ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් "ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එහි නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ—

(අ) ප්‍රවාහනය පිළිබඳ විෂයෙහි සුදුසුකම්ලත් පුද්ගලයන්ගේ ප්‍රමාණවත් සැපයුමක් සහතික කිරීම ;

(ආ) මේ විෂයෙහි යෙදී සිටින වෘත්තිකයන් සහ අතිකුත් තැනැත්තන් අතර ප්‍රවාහනය පිළිබඳ පර්යේෂණ සහ පුහුණුව ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) රටට උචිත ප්‍රවාහන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමෙහි ලා සහායවීම ;

(ඈ) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් ක්‍රියා හා දේවල් කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හා ඒවා අනුව තෝරා පත්කර ගනු ලබන ඒ රීති වලින් විධිවිධාන සලස්වා ඇති සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත පාලක සභාවක් විසින් එකී රීති වලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතුය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනට පෙරාතුව ම වූ දිනයේ ආයතනයේ පාලක සභාවේ තිල දරන සාමාජිකයෝ සංස්ථාවේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන තුරු ප්‍රථම පාලක සභාවේ සාමාජිකයන් හැටියට සලකනු ලබති.

සංස්ථාවේ රීති.

5. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සම්බන්ධයෙන් ද, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි වන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙරාතුව වූ දිනයේ දී බලපැවැත්වූ ආයතනයේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මෙම වගන්තිය යටතේ පනවනු ලබන රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මෙම පනත යටතේ සාදනු ලබන රීති මගින් සංශෝධනය කිරීම, එයට යමක් එකතු කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම කළ හැකි වන්නේ ය.

දේපළ දැරීමට සංස්ථාව සතු බලය.

**6.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල හෝ දේපළක් භාර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය සහ හැකියාව ඇති අතර ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන් ආකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

ගාස්තු හා දායක මුදල් අයකර ගැනීමට ඇති බලය.

**7.** මෙම සංස්ථාවට පහත සඳහන් ආකාරයට ගාස්තු හා දායක මුදල් අය කිරීමට නීත්‍යානුකූලව බලය සහ හැකියාව තිබිය යුතු ය–

(අ) සංස්ථාව විසින් පවත්වනු ලබන ඕනෑම විභාගයකට හෝ පාඨමාලාවකට ඇතුළත් වීම සඳහා සංස්ථාව විසින් සාධාරණ යයි සලකනු ලබන ගාස්තු ප්‍රමාණයක් අය කිරීමට ;

(ආ) සංස්ථාවේ ඕනෑම පන්තියක සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීමට ගාස්තු ; සහ

(ඇ) සංස්ථාවේ සාමාජිකයන්ගෙන් අයකර ගැනීම උචිත යයි සංස්ථාව විසින් සලකනු ලබන දායක මුදල් සහ ගාස්තු.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**8.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා

එකතු කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කරවීමේ, සේවයේ යෙදවීමේ හා සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

අයතනය විසින් හා ආයතනයට ගෙවිය යුතු ණය.

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම දිනයේ දී ආයතනයේ පැවති සියලු ණය හා බැරකම් මෙමගින් සංස්ථාපනය කළ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී එකී ආයතනයට ලැබිය යුතු හා අයවිය යුතු සියලු ණය හා දයක මුදල් මෙමගින් සංස්ථාපිත සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** සංස්ථාවේ පාලක සභාවේ සාමාජිකයින් දෙදෙනකු ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසියම් සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, එකී තැනැත්තන් විසින් සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවෙක් වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

විගණනය සහ ගිණුම්.

**11.** (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(ආ) සංස්ථාව විසින් එහි ආදයම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නියි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්–

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින් ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම් වලට හෝ මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බල පෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.